# ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

## තනතුරු පුරප්පාඩු

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි පහත සඳහන් තනතුරු සඳහා නිසි සුදුසුකම් සපුරන ලද ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂක (තනතුරු -01)

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද:**

**අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය, වාණිජ, ගිණුම්කරණය, ව්‍යාපාර පරිපාලනය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

   සමග

   අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ( Masters) ලබා තිබීම / තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

   සහ

   ප්‍රථම උපාධි සුදුසුකම ලබාගැනීමෙන් පසුව රජයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරුවල අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

   හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම

   සහ

   රජයේ , රජයේ සංස්ථාවක , මණ්ඩලයක,ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : HM 1-3 : රු. (152,500 - 15 X 4,100 - 214,000/-)

2025.01.01. දිනට ගෙවන මුදල -රු.113,556/-,2026.01.01. දිනට ගෙවන මුදල - රු.133,028/-, 2027.01.01 -රු.152,500/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) EPF -15%, ETF 3%, ජීවන වියදම් දීමනාව,

## අභ්‍යන්තර විගණක II (තනතුරු - 01)

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද:**

1.1 අයදුම්කරුවන් : (පහත සුදුසුකම් 1.2 හෝ 1.3)

1.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය, වාණිජ, ගිණුම්කරණය හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතු වලට අදාළව අවම වශයෙන් වසර (01) ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

1.3 තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : MM 1-1 : රු. (91,690 - 10 X 2,480+15X 3,450 - 168,240)

2025.01.01. දිනට ගෙවන මුදල - රු.71,730/-, 2026.01.01. දිනට ගෙවන මුදල - රු.81,710/-, 2027.01.01 -රු.91,690/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) EPF - 15%, ETF - 3%, ජීවන වියදම් දීමනාව,

## ගණකාධිකාරී II (තනතුරු -01)

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද:**

1.1 අයදුම්කරුවන් : (පහත සුදුසුකම් 1.2 හෝ 1.3)

1.2 විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර කළමනාකරණය, මූල්‍ය, වාණිජ්‍ය, ගිණුම්කරණය, හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගිණුම් කටයුතු වලට අදාළව අවම වශයෙන් වසර (01) ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

1.3 තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර (01) ක පළපුරුද්දක් ලබා තිබීම,

**වැටුප් පරිමාණය** : MM 1-1 : රු. (91,690 - 10 X 2,480+15X3,450 - 168,240)

2025.01.01. දිනට ගෙවන මුදල - රු.71,730/-, 2026.01.01. දිනට ගෙවන මුදල - රු.81,710/-, 2027.01.01 -රු.91,690/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) EPF 15%, ETF-3%, ජීවන වියදම් දීමනාව.

## තොරතුරු තාක්ෂණ කළමනාකරු II (තනතුරු - 01)

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :**

1.1 අයදුම්කරුවන්

1.2 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තොරතුරු තාක්ෂණ විද්‍යා උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම සහ සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය** : MM 1-1: රු. (91,690 - 10 X 2,480+15 X 3,450 - 168,240)

2025.01.01. දිනට ගෙවන මුදල - රු.71,730/- ,2026.01.01. දිනට ගෙවන මුදල - රු.81,710/-, 2027.01.01 -රු.91,690/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව) EPF 15%, ETF - 3%, ජීවන වියදම් දීමනාව,

**වෙනත් : (සෑම අයදුම්කරුවෙක්ම):**

- අධ්‍යක්ෂක තනතුර සඳහා, වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.
- අභ්‍යන්තර විගණක II, ගණකාධිකාරී II, තොරතුරු තාක්ෂණ කළමනාකරු II තනතුරු සඳහා, වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.
- තනතුරෙහි රාජකාරී ඉටු කිරීම සඳහා සුදුසු ශාරීරික සහ මානසික සෞඛ්‍යයකින් හෙබි අයෙකු විය යුතු අතර, දිවයිනෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකිවිය යුතුය. විශිෂ්ට චරිතයකින් හෙබි අයෙකු විය යුතුය. ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂා පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් වශයෙන් සැලකේ.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගැනීම සිදු කරනු ලැබේ.
- සම්පූර්ණ නම, උපන් දිනය, වයස, ජාතිය, අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද සහ වෙනත් සඳහන් කළ යුතු තොරතුරු ඇතුළත් ඥාතීන් වන පුද්ගලන් දෙදෙනෙකුගේ නම් සහ ලිපින සහිත අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමඟ සභාපති, ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල, 8 වන මහල, සතොස මහලේකම් ගොඩනැගිල්ල, 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2025/07/25 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- අයදුම්පත්‍ර කෙටි ලේඛනගත කිරීමේ අයිතිය ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සතුවේ.
- අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත්‍ර භාර ගනු නොලැබේ.
- මේ සම්බන්ධයෙන් ඔබ විසින් වැය කරනු ලබන ගමන් වියදම් හෝ වෙනත් වියදම් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මඟින් ප්‍රතිපූර්ණය කරනු නොලැබේ.

**සභාපති,**

**ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල,**

**8 වන මහල, සතොස මහලේකම් ගොඩනැගිල්ල,**

**අංක 27, චොක්ෂෝල් වීදිය, කොළඹ 02.**

**දුරකථන : 0112685011, ෆැක්ස් : 0112675524,** **විද්‍යුත් තැපෑල : mahapolafinance@gmail.com**